කප්පම් ඉල්ලූ බවට සැක පිට අත්අඩංගුවට ගැනුණු කාන්තාවක් සම්බන්ධයෙන් වාර්තා කරන දිනමිණ පුවතක අන්තර්ගතයේ, සැකකාරිය "ද්‍රවිඩ" යැයි දක්වා තිබේ.

වාර්ගිකත්වය පුවත් වාර්තාවන් තුළ සඳහන් කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය මාර්ගෝපදේශයන් පවසන්නේ, යම් පුවතකට ඍජුව අදාල නොවන්නේ නම්, පුද්ගලයකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ වාර්ගිකත්වය හෝ ජාතිය පිළිබඳව තොරතුරු පළ නොකරන ලෙසට වේ.

එසේ නම්,

1) අදාළ සැකකාරියගේ වාර්ගිකත්වය දිනමිණ පුවත තුළ "ද්‍රවිඩ" ලෙසින් දක්වා ඇත්තේ මන්ද? එම සැකකාරියගේ වාර්ගිකත්වය පුවතට අදාළ වන්නේ කෙසේද?

2) මෙසේ ඍණාත්මක සන්දර්භයන් තුළ අදාළ නොවන වාර්ගිකත්වයන් පළ කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වයට අයත් කණ්ඩායම් සම්බන්ධයෙන් ගර්හාත්මක සහ කොන් කිරීමේ ආකල්ප වර්ධනය වීමේ අවදානමක් නැතිද?

අදාළ නොවන වාර්ගිකත්වයන් සඳහන් නොකරමු!

